ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2014/10/31 |

## 2014 ඔක්තෝබර් මාසයේ දී උද්ධමනය සැලකිය යුතු ලෙස පහළ වැටේ.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ (කො.පා.මි.ද.) (2006/07=100) විචලනය මගින් මනිනු ලබන උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත 2014 සැප්තැම්බර් මස වාර්තා කළ සියයට 3.5 හි සිට 2014 ඔක්තෝබර් මාසයේ දී සියයට 1.6 දක්වා පහළ වැටිණි. මෙය 2009 ඔක්තෝබර් මාසයෙන් පසු වාර්තා කළ අඩුතම අගය වේ. විදුලිය ගාස්තු සියයට 25 කින් පමණ පහළ දැමීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. වාර්ෂික සාමාන්‍ය පදනම මත උද්ධමනය ද 2014 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 4.2 සිට 2014 ඔක්තෝබර් මාසයේ දී සියයට 3.8 දක්වා පහත වැටිණි.



ආහාර නොවන කාණ්ඩයට අයත් අයිතමයන්ගේ මිල ගණන් පහළ යාම ප්‍රධාන වශයෙන්ම හේතුකොට ගෙන 2014 ඔක්තෝබර් මාසයේ දී කො.පා.මි.දර්ශකය සියයට 1.6 ක මාසික පහළයාමක් වාර්තා කළේය. මේ සඳහා විදුලිය ගාස්තු සහ එල් පී ගෑස් හා ඉන්ධන මිල ගණන් පහළ හෙළමින් කළ සංශෝධන ප්‍රධාන වශයෙන් ඉවහල් විය. ඒ අනුව, ආහාර නොවන කාණ්ඩයේ, නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන; සහ ප්‍රවාහන යන උප කාණ්ඩයන්හි මිල ගණන් 2014 ඔක්තෝබර් මාසයේ දී පහළ ගියේය. රෙදිපිළි හා පාවහන්; සෞඛ්‍ය; විනෝදාත්මක හා සංස්කෘතික; අධ්‍යාපන; සහ විවිධ භාණ්ඩ හා සේවා යන උපකාණ්ඩයන්ගේ මිල ගණන් මෙම මාසය තුළ දී ඉහළ ගියේය. මේ අතර, ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තුව; සහ සන්නිවේදන යන උපකාණ්ඩයන්ගේ මිල ගණන් 2014 ඔක්තෝබර් මාසය තුළ නොවෙනස්ව පැවතිණි.

ප්‍රධාන වශයෙන්ම, සමහර සහල් වර්ග, බොහෝ එළවළු වර්ග, පරිප්පු, බිත්තර සහ පොල් ආදියෙහි සාමාන්‍ය මිල ගණන් ඉහළ යාම හේතුකොට ගෙන ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග අයත් උපකාණ්ඩයේ මිල ගණන් මාසය තුළ සුළු වශයෙන් ඉහළ ගියේය. කෙසේ වුවද, බොහෝ නැවුම් මත්ස්‍ය වර්ග, පොල්තෙල්, අර්තාපල්, රතු ළූනු, ලොකු ළූනු සහ අමු මිරිස් ආදියෙහි සාමාන්‍ය මිල ගණන් මෙම මාසය තුළ පහළ වැටීම උද්ධමන පීඩනය අඩු කිරීම සඳහා උපකාරී විය.

ආර්ථිකයේ යටිදැරි උද්ධමනය පෙන්නුම් කරන මූලික උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත 2014 සැප්තැම්බර් මාසයේ දී පැවති සියයට 3.7 හි සිට ඔක්තෝබර් මාසයේ දී සියයට 3.6 දක්වා පහළ ගියේය. වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය පූර්ව මාසයේ වාර්තා කළ සියයට 3.2 හි සිට ඔක්තෝබර් මාසයේ දී සියයට 3.3 දක්වා ඉහළ ගියේය.